**ශීර්ෂ 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය.**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල.**

(අ) මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ආ) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඇ) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඈ) ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඉ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඊ) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(උ) යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඌ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(එ) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඒ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ඔ) අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**1.1 විගණන විෂය පථය.**

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 31 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්.**

**2.1 විසර්ජන ගිණුම.**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම.**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 480.83 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 479.77 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු. මිලියන 1.06 ක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.22 ක් ලෙස පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 429.58 | 429.48 | 0.10 | 0.02 |
| මූලධන | 51.25 | 50.29 | 0.96 | 1.87 |
| **එකතුව** | **480.83** | **479.77** | **1.06** | **0.22** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය.**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 27 කින් හා දෙපාර්තමේන්තු 21 කින් එකතුව රු.මිලියන 3,097.89ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, ඉන් රු. මිලියන 2,741.40 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 356.49 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්.

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම.

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25901 | 38.0 | 37.4 | 27.0 | 25.7 | 150.0 | 126.2 |

## 2.3 පොදු තැන්පත් ගිණුම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.මිලියන 202.7 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණ.

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ජේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ජේදයේ සිට 3.13 ජේදය දක්වා වූ ජේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**

---

**3.1 සීමා නොපිළිපැදීම.**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළව පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු ලැබීම්වල අවම සීමාව රු.27,000,000 ක් වුවද, රු.1,274,013 කින් එම සීමාවට ලඟාවී නොතිබුණි.

**3.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන.**

---

2014 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 27 කින් හා දෙපාර්තමේන්තු 21 කින් එකතුව රු.මිලියන 3,097.89 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, ඉන් රු.මිලියන 2,741.40 ක් එනම් සියයට 88 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.1,610,191,940 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,372,487,945 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කළ "2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්වැලෙහි" සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූල නොවී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් රු.278,384,336 ක් වූ ව්‍යාපෘති 463 ක වැඩ අවිච්ඡේද කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2015 මැයි 31 දින වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ශීර්ෂ 105 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් විවිධ ව්‍යාපෘති සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් 2014 දෙසැම්බර් 31 දින වනවිට මිලදී ගෙන තිබුණු එකතුව රු.42,021,979 ක් වූ භාණ්ඩ ඒකක 10977 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක මාස 06 කට ආසන්න කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව රඳවාගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ රු.294,090,247 ක වටිනාකමින් යුතු පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති 08 ක් 2014 දෙසැම්බර් 31 දිනට අවිච්ඡේදව පැවතුණි. මේ සම්බන්ධයෙන් 2015 මැයි 31 දින වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) නාය යෑමට ලක්වූ ප්‍රදේශවල ජනතාවට අලුතින් ලබාදුන් ඉඩම්වලට ජල පහසුකම් සැපයීම වෙනුවෙන් ගමනැගුම වැඩසටහන යටතේ 2014 මැයි 27 දින රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.2,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු නමුත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඊ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේදී රු.1,000,000 ක වියදමින් සංවර්ධනය කර තිබුණු කලෝගහඇල සතිපොල පිහිටි ඉඩම රජයට පවරා ගෙන නොතිබුණි. එමෙන්ම සංවර්ධනය කරන ලද සතිපොල භාවිතයට ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ විධිමත්ව රජයට පවරා ගැනීමකින් තොරව දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,550,000 ක වියදමින් ඉදිකරන ලද වෙලන්ගොල්ල ක්‍රීඩාපිටියේ සංවර්ධන කටයුතු සතුටුදායක ලෙස නිම නොකිරීම නිසා ක්‍රීඩාපිටිය භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් වෙත ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ 03 කින් හා දෙපාර්තමේන්තුවකින් ලැබී තිබුණු රු.2,092,253 ක ප්‍රතිපාදන අදාළ අරමුණුගත කාර්යයන් සඳහා යොදවා නොගැනීම නිසා ඉතිරිව පැවතුණි.

(එ) 2014 වර්ෂයේදී අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 02 ක් විසින් වැය විෂයයන් 05 ක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු රු.7,031,431 ක ප්‍රතිපාදන ප්‍රමාණය රු.323,831 කින් ඉක්මවා වැය කර තිබුණි. අතිරේකව වැය කළ වටිනාකම ගිණුම්ගත කළ වැය විෂයයන් හඳුනා ගැනීමට නොහැකි විය. එම අතිරේක වියදම් අදාළ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම.**

වර්ෂ 2 ක් ඉක්ම වූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.3,598,556 ක් වූ තැන්පතු ශේෂ 68 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

විෂය අංක 25901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.726,306 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයකට අයත් වූ අතර එම ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආපදා ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර සීමාව ඉක්මවා රු.130,300 ක ණය ලබා දී තිබුණි.

(ඇ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාර, නිලධාරියෙකු ස්ථාන මාරුවී මාස 03 ක් ඇතුළත ණය ශේෂ නිරවුල් කළ යුතුව තිබුණි. එහෙත් ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා මාස 06 සිට මාස 08 ක් දක්වා කාලයක සිට හිඟහිටව තිබූ රු.184,760 ක් වූ ණය ශේෂ 03ක් සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

2010 වර්ෂයේදී රු.1,673,219 ක වියදමින් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ඉදිකර තිබුණු බත්ගම්පල සහල් සැකසීමේ මධ්‍යස්ථානය අවස්ථා කිහිපයකදී ගනුලැබූ තීරණ මත, පුද්ගලික ව්‍යාපාරිකයෙකුට බදුදීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් නොහැකි වී තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිකළ ගොඩනැගිල්ල, කමත, ජල ටැංකිය හා සහල් නිෂ්පාදනය සඳහා මිලදී ගෙන තිබුණු යන්ත්‍ර 02 ක් නිෂ්කාර්යව හා විනාශවීමේ අවදානමකට ලක්ව පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන ලද සමස්ථ වියදම නිෂ්ඵල වියදමක්ව පැවතුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්.

2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් බේරුම් නොකළ වසරකට වඩා අඩු කාලයක සිට පැවැත එන රු.1,421,010 ක් වූ බැරකම් පැවැතුණි. වැය විෂයයන් දෙකකට අදාළ එකතුව රු.52,533 ක්වූ බැරකම් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

**3.6 අනුකූල නොවීම්.**

**බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම.**

**එකතු කළ අගය මත බදු ගෙවීම්.**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක අවස්ථා 26 කදී ගෙවා තිබූ රු.157,058 ක එකතු කළ අගය මත බදු පිළිබඳව වාර්තා ගෙවීම් කළ මාසයට පසුව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දී නොතිබුණි.

**3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම.**

පල්ලේපොල සහ උකුවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.2,500,000 ක වියදමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණු ව්‍යාපෘති 7ක් ආරම්භ නොකර අතහැර තිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් .**

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළාත් නැගුම වැඩසටහන යටතේ ඉනාමළුව ග්‍රාමීය ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් රු.2,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු.1,477,149 ක බිල්පත් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. ප්‍රමාණ පත්‍රයේ සඳහන් අංක 17 සිට අංක 25 දක්වා වූ වැඩ විෂයයන් ඉටුකර නොතිබූ බවත්, ගිවිසුම් ප්‍රකාරව 2015 ජනවාරි 10 දින වැඩ නිමකර ගොඩනැගිල්ල භාර දිය යුතු වුවත්, 2015 අප්‍රේල් 09 දින වන විටත් එය භාරදී නොතිබුණු බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තය නිම නොකිරීම සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කාර්යාලය කටයුතු කර නොතිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති.**

ඉදිකිරීම් සම්බන්ධව ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත අදාළ මුළු මුදලම හෝ කොටසක් නිදහස් කර තිබුණු නමුත්, වැඩ පිළිබඳ නිසි ප්‍රගතියක් නොමැති අවස්ථා දක්නට ලැබුණි.

(i) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 2ක් යටතේ විදුලි දිගු ලබාදීම සඳහා ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයට 2014 දෙසැම්බර් මාසයේදී රු. 617,824 ක මුදලක් ගෙවා තිබුණද, 2015 ජූනි මස වන විටත් එම විදුලි සම්බන්ධතා ලබා දී නොතිබුණි.

(ii) පළාත් නැගුම ව්‍යාපෘතිය යටතේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගල උඩහේනගම සහ බ්‍රැන්ඩිගල යන ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට තීරණය කර තිබුණි. ඒ සඳහා රු.5,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට මූලික උද්‍යාන කටයුතු සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවටද, අනෙකුත් කටයුතු සඳහා තවත් බාහිර පාර්ශවයන් වෙතද, එකතුව රු.1,311,652 ක් ගෙවා තිබුණි. 2015 ජූනි මාසය වන විටද කිසිදු නිර්මාණ කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

(iii) මාතලේ මඩවල උල්පත ප්‍රදේශයේ පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,957,201 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට 2014 ඔක්තෝබර් 10 දින හා 2014 දෙසැම්බර් 12 දින ගෙවා තිබුණි. 2015 ජූනි මාසය වන විටත් එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර නොතිබුණි.

**3.8 කාර්යසාධනය.**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

වන ජීවින්ගෙන් ජනතාවට සිදුවන හානි අවම කිරීම හා වැළැක්වීම මූලික අරමුණ කරගෙන 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද “ වන රොද හා වන සංරක්ෂණ ” වැඩ සටහන එකී අරමුණුවලට අනුකූල නොවී දඹුල්ල හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම්

කාර්යාල විසින් පිළිවෙලින් තල්කොටේ හා පිබිදුනු ගම වන ජීවී කාර්යාල 2ක් හා නේවාසිකාගාර 2 ක් ඉදිකිරීමට රු. 9,500,000 ක ප්‍රතිපාදන සළසාගෙන 2014 දෙසැම්බර් 31 දින වන විට ඒ වෙනුවෙන් රු. 1,773,215 ක වියදම් දරා තිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්.**

-----------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) 2014 වර්ෂයේදී රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.10,000,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු අතර ඉන් රු.8,744,186 ක් වැය කර ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. 2015 ජූලි මාසය වන විටත් ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ පළාත් නැගුම වැඩසටහන යටතේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ගොවීන්ට හා වතු සේවකයින්ට අව්වෙන් හා වැස්සෙන් ආරක්ෂා වීමට හිස් වැසුම් සැපයීම වෙනුවෙන් රු.910,000 ක් වැය කර ජාතික ශිල්ප සභාවෙන් ඉදිකොළ තොප්පි 1400 ක් මිලදී ගෙන තිබුණි. ප්‍රතිලාභීන් අතර ඒවා බෙදා නොහැර 2015 ජූනි මාසය වන විටද කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණි.

(iii) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී පාසල්වලට බෙදාදීම සඳහා රු.95,600 ක් වැයකර ගැටබෙර 16ක් මිලදී ගෙන තිබුණි. නියමිත පරිදි ඒවා පාසල්වලට බෙදා දීමට කටයුතු කර නොතිබුණි. 2015 ජූනි මාසයේදී කරන ලද ස්ථානීය පරික්ෂාවේදී රු. 65,725 ක් වටිනා ගැටබෙර 11 ක් මීයන් කා විනාශයට පත්වී තිබුණි.

**(ඇ) සැලසුම් කිරීම.**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කෘෂිකර්ම ඒකකය මගින් 2014 වර්ෂයේ සැලැසුම් කර තිබූ පළතුරු ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ලොකු ලූණු ගබඩා 500 ක් ඉදිකිරීමට සැලැසුම් තර තිබුණත් ව්‍යාපෘතිය මගින් ඉන් ගබඩා 357 ක් ඉදිකර නොතිබුණි.

**3.9 අවිධිමත් ගනුදෙනු.**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කරවිගහවැව පොළ ලඟ සිට බෝගහවැව මායිම දක්වා වූ මාර්ගයේ බොරළු ඇතිරීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, අළුතින් බොරළු යෙදූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොතිබියදී මෙම කර්මාන්තය සඳහා රු.574,412 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) 2014 සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ රු.5,000,000 ක ප්‍රතිපාදන මත සීගිරිය පොල්ලත්තාව මාර්ගයේ තාර දැමීම සඳහා වූ කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානයකට සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය යටතේ ලබාදීමට නොහැකි වුවත්, 2014 ජූනි 04 දින සිට 2014 ජූලි 25 දින දක්වා කාලය තුළ අදියර 3 කට බෙදා කොන්ත්‍රාත්තුව එකම ගොවි සංවිධානයක් වෙත ලබා දී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය හා 2011 සැප්තැම්බර් 27 දින අංක 452 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් අනුව ලංසු කැඳවීම් කර ඉංජිනේරුවරයකුගේ අධීක්ෂණය යටතේ කර්මාන්තය ඉටුකර නොතිබුණි.

**3.10 පාඩු හා හානි.**

2014 වර්ෂයේ අනතුරු 05 කින් එකතුව රු.689,486 ක් වූ අලාභහානි සිදු වී තිබුණි. එම අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ වගකිව යුතු අයගෙන් අයකර ගැනිමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.11 අනාර්ථික ගනුදෙනු**

උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඇල්කඩුව නගරයේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා රු.6,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. වතු සමාගමකට අයත් සරුසාර තේ වගා බිමක මෙම ක්‍රීඩා පිටිය සකස් කිරීමට තෝරා ගැනීම හේතුවෙන් ඒ සඳහා වතු සමාගමට රු.900,000 ක වන්දියක් ගෙවීමට සිදුවී තිබුණි. 2014 දෙසැම්බර් 19 දින වන විට ව්‍යාපෘතිය සඳහා රු.2,606,284 ක් වැය කර තිබුණත්, 2015 ජූනි මාසය වන විට ක්‍රීඩා පිටිය සකස් කිරීමේ කටයුතු අත්හැර තිබුණි. එමෙන්ම 2015 ජූනි 09 දින වන විට කොන්ත්‍රාත්කරුගේ රක්ෂණාවරණය ද නිදහස් කර තිබුණි.

**3.12 කළමනාකරණ දුර්වලතා**

රජයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් අවස්ථා 44 කදී මාතලේ, පල්ලේපොල, උකුවෙල, දඹුල්ල හා නාඋල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර වර්ෂ 5 ක සිට වර්ෂ 30 ක් දක්වා කාලයක් ගත වී තිබුණත්, එම පවරා ගැනීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 25 | 16 |
| (ii) | තෘතියික මට්ටම | 34 | 23 | 11 |
| (iii) | ද්විතියික මට්ටම | 890 | 804 | 86 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 118 | 111 | 07 |
| | **එකතුව** | **1,083** | **963** | **120** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවැති පුරප්පාඩු 120 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විධිමත් ස්ථානමාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයට අයත් විල්ගමුව සහ ලග්ගල පල්ලේගම වැනි දුෂ්කර ප්රාදේශීය ලේකම් කාර්යාලවල තනතුරු 09 ක පුරප්පාඩු 37ක් පැවතුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අනුයුක්ත සංවර්ධන නිලධාරි තනතුරු සඳහා පුරප්පාඩු 18 ක් තිබියදීත්, එක් නිලධාරිනියක 2013 අගෝස්තු 01 දින සිට පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට නිදහස් කර තිබූ අතර, එදින සිට පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ඇයගේ වැටුප් ප්‍රතිපූරණය කර තිබුණි.